මගේ අංකය
எனது இல.
My Number

D2/QSIP/2025

ඔබේ අංකය
உமது இல.
Your Number

දිනය
திகதி
Date

2026.03. 26

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

සියලුම දිස්ත්‍රික් අංශ ප්‍රධානී,

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය.

කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය - 2026

පළමුවන කාර්තුව ජනවාරි - මාර්තු)

ඉහත සමීක්ෂණය සඳහා දත්ත ලබා ගැනීම බහුවිධ ක්‍රමවේදයන් ඔස්සේ සිදු කිරීමටත් මෙම සමීක්ෂණ නව ක්‍රමවේද ඔස්සේ සංවිධානය කිරීමටත් අප අංශය විසින් කටයුතු කරමින් සිටී.

02) ඒ අනුව මෙම සමීක්ෂණයට අදාල වන ලේඛන මේ වන විට අප දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළ ප්‍රකාශයට පත් කර ඇත. (ඒ සම්බන්ධව E mail පණිවිඩයක් ඔබ වෙත එවා ඇත) ඒ සමඟම ආයතන වෙත යොමු කිරීමට අදාළ වන අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන සහිත සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කළ ආවරණ ලිපි, දෘඩ පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් සකස් කළ ප්‍රශ්නාවලී හා ආයතන වෙත E mail කිරීම සඳහා සකස් කළ ප්‍රශ්නාවලිය (Excel format) ද ඔබ වෙත යොමු කර ඇත. ඒ අනුව ඔබ විසින් අවශ්‍යතාව පරිදි අදාළ ලිපි බාගත කර දෘඩ හෝ මෘදු පිටපත් ආයතන වෙත යොමු කොට සමීක්ෂණයට අදාළ තොරතුරු ලබා ගැනීමේ කටයුතු දිස්ත්‍රික් කාර්යාල මඟින් සම්බන්ධීකරණය කළ යුතුව පවතී.

03) ඉහත සමීක්ෂණයට අදාළව 2026 පළමුවන කාර්තුවට අදාළ දත්ත ලබාගැනීමට අදාළ වන ප්‍රා.ලේ. කොට්ඨාසය මට්ටමින් වූ කර්මාන්ත ආයතන රාමුව හා දිස්ත්‍රික්කය භාර නිලධාරියා විසින් දිස්ත්‍රික්කය වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අධීක්ෂණ වාර්තාවෙහි ආකෘති පත්‍රය (QSS-1) මේ වන විට දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත E mail කර ඇත.

04) 2026 පළමුවන කාර්තුවේ තොරතුරු සියලුම ආයතන වෙතින් 2026 මාර්තු මස අවසන් වූ විගස ලබා ගෙන 2026/05/03 දින හෝ ඊට පෙර උපලේඛනවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමෙන් පසු, ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කඩිනමින් දෙවන අංශය වෙත එවිය යුතු බව කාරුණිකව දන්වමි.

.....

කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්